**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ**
**ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ ව්‍යාපෘති සංවර්ධන සහකාර (දෙපාර්තමේන්තුගත)**
**තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය**

01. **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : රාජ්‍ය භාෂා
යොමු අංකය: DOL/AD/02/04 දිනය : 2023.09.14

1.2 අමාත්‍යාංශය : රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන
යොමු අංකය:MPA/ADM/EST/GA19/Dep.Lan දිනය: 2023.10.12

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය: DMS/1137/Vol.III දිනය: 2023.04.28

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය: EST-2/03/REC/6410 දිනය: 2023.06.22

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය: NPC/10/07/28/SR-1 දිනය: 2022.06.10

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය: PSC/EST/08-01-25/02/2023 දිනය: 2025.02.03

02. පත් කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරී

3.2 ශ්‍රේණි : III ,II , I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය:

ආයතනික අරමුණු ඉටුකිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය, වාර්තා සම්පාදනය , සමීක්ෂණය වැනි කාර්යයන් අතුරින් නිශ්චිත කාර්යභාරයක් පැවරෙන්නාවූද බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් අවශ්‍යවන්නා වූද කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය: ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

nd



CamScanner